සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2018 සැප්තැම්බර්

**(01)** භාෂා හැකියාව

පැ තුනයි

## විභාග අපේක්ෂකයන්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට පැහැදිලිව ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

..................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් හා ප්‍රශ්න **38** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 2 | 1 – 12 | |
| 3 | 13 – 25 | |
| 4 | 26 – 35 | |
| 5 - 6 | 36 | |
| 7 - 8 | 37 | |
| 8 - 10 | 38 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් එක් පදයක පමණක් අක්ෂර වින්‍යාසය වැරදිය. එම පදය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

1. (1) භූතාරූඪය (2) අධ්‍යාත්මික (3) අග්‍රගණ්‍ය (4) සමාජීය විද්‍යා (.........)

2. (1) ජාත්‍යාලය (2) අවස්ථෝචිත (3) ප්‍රදර්ශණය (4) විශ්ලේෂණය (.........)

3. (1) කොට්ඨාශය (2) ශීඝ්‍රතාව (3) පෞරුෂය (4) පශ්චාද්භාගය (.........)

● අංක **4** සිට **6** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වචන අකාරාදි පිළිවෙළට සකස් කළ විට නිවැරදිව දැක්වෙන අනුපිළිවෙළ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

4. අ. ක්‍රියාකාරීබලය ආ. කාර්යාවලිය ඉ. කාර්යසාධනය ඊ. කෘත්‍යාධිකාරිමණ්ඩලය
   (1) ඉ, ආ, ඊ, අ (2) අ, ආ, ඉ, ඊ (3) ඊ, ආ, ඉ, අ (4) අ, ඊ, ඉ, ආ (.........)

5. අ. සුචරිතය ආ. සුභනිමිත්ත ඉ. සුද්ධාවාස ඊ. සුගතිය
   (1) අ, ආ, ඊ, ඉ (2) අ, ඊ, ආ, ඉ (3) ඊ, අ, ඉ, ආ (4) ඉ, ඊ, අ, ආ (.........)

6. අ. ආලෝකය ආ. ආලෝකවර්ෂය ඉ. ආලෝකතරංග ඊ. ආලෝකකරණය
   (1) අ, ඊ, ආ, ඉ (2) අ, ආ, ඉ, ඊ (3) ආ, ඊ, අ, ඉ (4) ඊ, ඉ, අ, ආ (.........)

● අංක **7** සිට **9** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අතුරින් නිවැරදිව විසන්ධි කර නොමැති පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

7. (1) සර්වාභරණ = සර්වා + භරණ (2) මිථ්‍යාචාර = මිථ්‍යා + ආචාර
   (3) නීත්‍යනුකූල = නීති + අනුකූල (4) අත්‍යලංකාර = අති + අලංකාර (.........)

8. (1) වාක්කෝෂ = වාච් + කෝෂ (2) තද්භව = තත් + භව
   (3) ගුරුතුමා = ගුරු + උතුමා (4) සමුපකාරය = සම + උපකාරය (.........)

9. (1) අන්‍යෝන්‍ය = අන්‍යඃ + අන්‍ය (2) නීලෝත්පල = නීල + උත්පල
   (3) මහාර්ෂි = මහා + ඍෂි (4) විද්‍යෝදය = විද්‍යා + ඕදය (.........)

● අංක **10** ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 01 යි)*

10. අකුරු ගළපන ලද කල්හි අර්ථවත් වචනයක් සෑදෙන පිළිතුර කුමක් ද?
    (1) සනහානජහිය (2) විත්ඥාරලමය (3) පූළිර්යණිකත (4) බරන්ධරුන්ද (.........)

● අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍යය සදොස් වේ නම්, නිදොස් කොට සම්පූර්ණ වාක්‍යයම **තිත් ඉර** මත නැවත ලියන්න. නිදොස් වේ නම්, 'නිවැරදියි' යන්න පමණක් ලියන්න. *(ලකුණු 05 යි)*

11. මා නීතිඥයෙක් වූ නිසා ගුරුතුමා සතුටු වූහ.

.............................................................................................................

.............................................................................................................

12. ළදරු පාසලට ළමයින් බඳවා ගනු ලැබේ.

.............................................................................................................

.............................................................................................................

[ 3 වන පිටුව බලන්න.

13. දෙවනපෑතිස් රජු විසින් සංඝමිත්තා තෙරණින් වහන්සේත් බෝධි ශාඛාවක් පිළිගන්නා ලදි.

.......................................................................................................................

.......................................................................................................................

14. දූ දරුවන් විසින් මහලු මැණියන් රැකබලා ගන්නා ලදි.

.......................................................................................................................

.......................................................................................................................

15. ජී.බී. සේනානායකයන් නවකතාකරුවෙක් මෙන්ම විචාරකයෙක්ද විය.

.......................................................................................................................

.......................................................................................................................

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් නොගැළපෙන පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 05 යි)*

16. (1) අශ්ව (2) තුරඟ (3) හය (4) වරණ (.........)

17. (1) ඉඟ (2) අඟ (3) තුනු (4) වෙර (.........)

18. (1) සුත (2) දරු (3) පුත් (4) සුනු (.........)

19. (1) යෙහෙළි (2) සිකි (3) මිතුරි (4) අඟන (.........)

20. (1) දිය (2) අඹ (3) පැන් (4) රළ (.........)

● අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති තද කළු අකුරින් මුද්‍රිත යෙදුමට සමාන තේරුම් දෙන වාක්‍යාංශය හෝ පදය හෝ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 05 යි)*

21. **දණ්ඩකින් පහර ලත් සර්පයකු සේ**
    (1) තැළී අඩපණ වූ (2) ප්‍රයෝජනයට ගත නොහැකි
    (3) කෝපයෙන් ඇවිස්සුණු (4) හොඳ නොහොඳ නොවැටහෙන (.........)

22. **ලුණු හොයන්ට ලේවායට ගියා වගෙයි**
    (1) නිශ්චිත ස්ථානය සොයා ගැනීම (2) නිෂ්ඵල ගමනක්
    (3) අවශ්‍ය දේ උපරිමව ලැබී තෘප්තිමත් වීම (4) යමක් මුල පටන් නිසි පරිදි වටහා ගැනීම (.........)

23. **කල දුටු කල, වළ ඉහ ගැනීම**
    (1) අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම (2) නිරර්ථක කාර්යයක නියැලීම
    (3) සිතීමට පවා අපහසු කටයුත්තක් ඉටු කිරීම (4) කෙනෙකු දුෂ්කරතාවට ඇද දැමීම (.........)

24. **කෝපි කාලෙ වැඩක්**
    (1) කෝපි වගාවට වැළඳෙන රෝගයක් (2) කෘෂිකර්මය හා සම්බන්ධ කෙම් ක්‍රමයක්
    (3) යල් පැන ගිය දෙයක් (4) කෝපි වගාව නගා සිටුවීමේ නව යෝජනාවලියක් (.........)

25. **ගුරු තරුව වැනි**
    (1) ගුරුවරුන් අතර දක්ෂයෙකි (2) ගුරුවරුන් සඳහා වන රක්ෂණ ක්‍රමයකි
    (3) ඉතා දීප්තිමත් (4) බලසම්පන්න රාජ යෝගයක් සහිත ග්‍රහ පිහිටීමකි (.........)

[ 4 වන පිටුව බලන්න.

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති තද කළු අකුරින් මුද්‍රිත පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. *(ලකුණු 05 යි)*

26. **ඇදුරු**
(1) පර්වතය (2) බලි අරින්නා (3) කුළුබඩු විශේෂයක් (4) ආචාර්යවරයා (.........)

27. **කිරණ**
(1) රශ්මිය (2) බැබළීම (3) කිරිමුහුද (4) බරමැනීම (.........)

28. **නා**
(1) නාගයා (2) නාමය (3) හස්තියා (4) නායක (.........)

29. **පහ**
(1) ප්‍රසාදය (2) ස්පර්ශය (3) ප්‍රාසාදය (4) පංචකය (.........)

30. **ලිය**
(1) ලේඛනය (2) දලු (3) ස්ත්‍රිය (4) වැල (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති එක් එක් වාක්‍යාංශයෙහි නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ අර්ථය දෙන වරණය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. *(ලකුණු 05 යි)*

31. මුදුන් පත් වීම
(1) ජයග්‍රහණය ලැබීම (2) ප්‍රධානත්වය හිමි වීම
(3) නායකත්වය ලැබීම (4) ඉටු වීම (.........)

32. සායම අරිනවා
(1) වර්ණ විරඤ්ජනය (2) රෙදි සෝදා වියළීම
(3) ගෞරවය හීන කිරීම (4) චිත්‍රයක අනවශ්‍ය වර්ණ ඉවත් කිරීම (.........)

33. බහින කලාව
(1) කලාත්මක ලෙස සකස් කළ පියගැට පෙළ
(2) පරිහාණිය
(3) විවෘත ආර්ථිකය නිසා කලාව පිරිහීම
(4) කලාකරුවන් අතර මත භේද (.........)

34. ඇගේ එල්ලෙනවා
(1) උදවු - උපකාර ලබා ගැනීම (2) අත්අඩංගුවට ගැනීම
(3) ප්‍රේම සම්බන්ධයක් ඇරඹීම (4) සර්පයෙකු දෂ්ට කිරීම (.........)

35. ඇඟ බේරා ගැනීම
(1) බෝවෙන සමේ රෝගයක් සුව වීම
(2) වරදකට හසු නොවී සිටීම
(3) රාජකාරිවලින් මඟ හැර සිටීම
(4) ඇඟ බද්ද ගෙවීමෙන් නිදහස ලැබීම (.........)

**36.** පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 03 × 5 = 15 යි)*

අනුරාධපුරයේ පිරිහීම ලංකාවේ දේශපාලන ඉතිහාසයේ පමණක් නොව විද්‍යාවේ සහ කාර්මික ඥානයේත් පරිච්ඡේදාවසානයකි. බලය අල්ලා ගැනීමේ පරමාර්ථය මුල් කොට ගෙන දකුණු ඉන්දියා රාජ්‍යයන් අතර පැවති පොරයේ ආරවුල්වලට සහ තරගවලට අභාග්‍යසම්පන්න ලෙස ලංකාව මැදිහත් වීමෙන් උද්ගත වූ නොසන්සුන් දේශපාලන තත්ත්වයෙන් හොඳින් පෙනෙන පරිහාණි ස්වරූපය අනුරාධපුර යුගයේ අවසාන භාගයේ පැහැදිලි ලෙසම දැකිය හැකිය. ලංකා ඉතිහාසයේ ඕනෑම වකවානුවක පැවති ස්ථිරභාවය සහ දියුණුව වාරි කර්මාන්තයෙන් හා ආගමික සිහිවටනයන්ගෙන් මැනේ නම් නවවැනි, දහවැනි ශතවර්ෂවල එබඳු කර්මාන්ත හෝ සිහිවටන හෝ නොමැති වීමෙන් පෙනී යන්නේ එකී අර්බුදකාරී ශතවර්ෂවලදී ලංකාවේ තත්ත්වය සතුටුදායක නොවූ බවයි.

දකුණු ඉන්දියා දේශපාලන කටයුතුවලට මැදිහත් වීමෙන්ද, එසේ මැදිහත් වීමේ ප්‍රතිඵල ලෙස ජාතික ධනය සහ ශක්තිය පිරිහී ගොස් හටගත් ආභ්‍යන්තරික දේශපාලන පරිහාණියෙන්ද, උද්ගත වූ විරුද්ධතාව නිසා, ලංකාව, ව්‍යාප්ත වෙමින් පැවති චෝළ අධිරාජ්‍ය බලයට නිරායාසයෙන්ම ගොදුරු විය. දකුණු ඉන්දියා ද්‍රවිඩ ශිෂ්ටාචාරය සමග ශතවර්ෂ දෙකතුනක් තිස්සේ පැවති ඉතා කිට්ටු සම්බන්ධකම්, උනුන්ගේ මත සහ දක්ෂකම් කෙරෙහි සෑහෙන අන්‍යෝන්‍ය බලපෑමකට හේතු විය යුතුව තිබිණි. ඒ බලපෑම ලංකාවේ විද්‍යාවේ සහ කාර්මික කෞශල්‍යයේ සෑහෙන ලෙස සලකුණු වන්නටද ඉඩ තිබිණි. ලංකාව චෝළ බලයට අවනත වීමත් සමගම හින්දු ආගම බුද්ධාගම කෙරෙහිද, දෙමළ භාෂාව සිංහල භාෂාව කෙරෙහිද බලපෑ ආකාරය අපට පැහැදිලිය. ලංකාවේ ස්වාධීපත්‍යයෙහි ආරක්ෂකයා ලෙස ප්‍රසිද්ධියට පත් I විජයබාහු රජුගේ කාලයේදී, පවා දෙමළ භාෂාවෙන් සෙල්ලිපියක් පළ කොට තිබීම විශේෂ කාරණයකි. විජයබාහුගෙන් පසු රජ පැමිණියවුන්ගේ කාලවලදීද ඇතැම් රාජාඥා දෙමළ භාෂාවෙන් ශිලාලේඛනගතව ඇත. "ඒවා දියුණුවේ සංකේතයක් ලෙස සලකනු ලැබීය."යි ආචාර්ය සෙනරත් පරණවිතාන අදහස් කරයි.

එහෙත් විද්‍යාව සහ කාර්මික කෞශල්‍යය කෙරෙහි එතරම් බලපෑමක් අපට දැකිය නොහැකිය. මේ පරස්පර විරෝධයට හේතු දෙකක් දැක්විය හැකිය. ඉන් එක් හේතුවක් නම් නිදහස ලැබීම සඳහා සිංහලයන් දැරූ ප්‍රයත්නය මැඩලමින් ලංකාවේ චෝළ බලය අස්ථිර, අවදානම් තත්වයක පැවතීමයි. මේ තත්ත්වය නිසා ලංකාවේ විද්‍යාවේ සහ කාර්මික කෞශල්‍යයේ උරුමයට අලුතින් යමක් එකතු කිරීමට ඔවුන්ට අවස්ථාවක් නොලැබුණේය. දෙවැන්න නම් එකල දකුණු ඉන්දියා ශිෂ්ටාචාරය උච්චාවස්ථාවට පත්ව තිබුණද අනුරාධපුර යුගයේදී ස්වාධීන ලෙස සංවර්ධනයට පත් ලංකා ශිෂ්ටාචාරයට දීමට තරම් දෙයක් එහි නොවීමයි. සිංහලයන්ගේ දියුණු ශිලා කර්මාන්ත සහ ලෝහ කර්මාන්ත පිළිබඳව මේ කියමන වඩාත් ගැළපේ. පොලොන්නරුවේ අංක 2 ශිව දේවාලයයේ ශිලා කර්මාන්ත ආචාර්ය සෙනරත් පරණවිතාන කියන පරිදි චෝල ගෘහ නිර්මාණයේ උසස්ම කෘති වෙතත් ඒවා අනුරාධපුර යුගයේ බෞද්ධ ශිලා කර්මාන්ත අසලකවත් තැබිය නොහේ. එසේම නිසැකයෙන්ම දකුණු ඉන්දියාවේ තනන ලද ශිව නටරාජ රූපය, සුන්දර මූර්තිස්වාමි රූපය වැනි කුඩා ලෝකඩ පිළිම, තාරා පිළිමය තරම් කාර්මික කෞශල්‍යයක් නොපෙන්වයි.

වංශකථාවන්හි සඳහන් වන්නේ දකුණු ඉන්දියා ආක්‍රමණ සහ ඒවායේ විනාශකාරී ප්‍රතිඵල පමණකි. සිංහල කාර්මික විද්‍යාඥයෝද ශිල්පීහුද රාජකීය අනුග්‍රහ නොලද්දාහු ස්වකීය වෘත්තීන් දියුණු කරගැනීමට අවස්ථාවක් නොලැබූහ. අනුරාධපුර යුගයේ කාර්ය බහුල කාල පරිච්ඡේදයත් චෝළයන් ලක්දිවින් නෙරපා හැරීමත් අතර වූ දීර්ඝ කාලය තුළ සිංහලයන්ගේ පැරණි කාර්මික ඥානය සහ කෞශල්‍යය රැක ගනිමින් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන ආවේ කෙසේද යනු පුදුමයට කරුණකි. ශතවර්ෂ කීපයක් වූ මේ අතර කාලය තුළදී අනුරාධපුර සම්ප්‍රදාය නොකඩවා ගෙන ආ බවට කෙළින්ම ලද හැකි සාක්ෂ්‍ය නැතත් එසේ ගෙන ඒමෙන් එක් කරුණක් නම් තදින්ම පැහැදිලිය. එනම්, ආධුනිකයන් සහ නවක ශිල්පීන් ප්‍රගුණ කරනු පිණිස උපයෝගී කරගන්නා ලද ශ්‍රේණි වශයෙන් හෝ කුල වශයෙන් සිදු වූයේ ඔවුන්ගේ විශේෂඥ දැනීම ආරක්ෂා වීමයි. ඒ දැනීම මීට පෙර යුගයේ ආධුනිකයනට ලැබුණේ කර්මාන්ත කිරීමේදීමය. එහෙත් එබඳු අවස්ථා නොලත් මේ අවධියේද ඔවුන් ඒ සඳහා භාවිත කළ ක්‍රම අද දවසේ අපට දැනගන්නට ඇත්නම් කාර්මික විද්‍යා අධ්‍යාපනයේ සංවර්ධනයට ඉවහල් වනු ඇත.

[ 6 වන පිටුව බලන්න.

(i) දිවයිනේ පැවති දේශපාලන ස්ථාවරත්වය හා දියුණුව මනින සාධක වශයෙන් මෙහි දැක්වෙන්නේ කවරක්ද?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(ii) දකුණු ඉන්දියානු බලපෑම විද්‍යා හා කාර්මික දියුණුවට හේතු නොවූයේ ඇයි?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(iii) චෝළ හා දකුණු ඉන්දියානු නිර්මාණ සසඳා ඇත්තේ කවර දේශීය නිර්මාණ සමගද?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(iv) කාර්මිකයන්ගේ හා ශිල්පීන්ගේ විශේෂඥ දැනුම ආරක්ෂා වූයේ කවර හේතු නිසාද?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(v) කාර්මිකයන්ට හා ශිල්පීන්ට ඔවුන්ගේ වෘත්තීන් දියුණු කර ගැනීමට අවස්ථා නොලැබුණේ මන්දැයි දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

[ 7 වන පිටුව බලන්න.

**37.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශය අවසානයේ සඳහන් කරන්න. *(ලකුණු 20 යි)*

පෘතුගීසි භාෂාව, එහි සංකර ස්වභාවයෙන් වුවද ලංකාවේ අද භාවිත නොවන තත්ත්වයකට පත්ව ඇත. එහෙත් එය, ජාතික භාෂා කෙරෙහි නොමැකෙන බලපෑමක් ඇති කර තිබේ. පෘතුගීසියෙන් ඇඳා ගත් බොහෝ වචන දැනුදු සිංහල, දෙමළ භාෂාවල දිනපතා භාවිත වේ. පෘතුගීසීන් රටේ භාෂා ඉගෙන ගැනීම වෙනුවට ඇත්ත වශයෙන් සිදු වූයේ පෘතුගීසීන් සහ ලාංකිකයන් අතර සමීප ආශ්‍රය නිසා පෘතුගීසිය වඩා බහුල ලෙස කථා කිරීම සහ එහි ප්‍රතිඵලයෙන් එය ජාතික භාෂා කෙරෙහි ආභාසයක් ඇති කිරීමය. එහෙත් ඒ අතරම සමහර සිංහල වචනත් දෙමළ වචනත් දේශීය ඉන්දු-පෘතුගීසි භාෂාවට එක් වී ඇති බව මතක තබා ගත යුතුය.

මුල් මිෂනාරීහු පරිවර්තකයන්ගේ සහාය ඇතිව ක්‍රිස්තියානි ධර්මය දේශනා කළහ. මෙය අසතුටුදායක ක්‍රමයක් හැටියට මිෂනාරීන්ටම වැටහුණු බවට සැකයක් නැත. පරිවර්තකයන් මගින් ඉගැන්වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ බව සාන්ත ප්‍රැන්සිස් සාවියර් තුමා තරම් අවබෝධ කරගත් අන් කිසිවෙක් නොවීය. එතුමාට එය අවබෝධ වූයේ තමා නොදත් භාෂා කථා කළ ජනයා සමග කථා බස් කිරීමේ ප්‍රශ්නයට මුහුණ පෑමට එතුමාගේ පෙරදිග ධර්මදූත දේශාටනවලදී (1542 - 1552) සිදු වූ විටය. එහෙයින් මිෂනාරීන් භාෂා හොඳින් දැන ගැනීමේ වැදගත්කම ගැන හේ ඇඩි ලෙස කියා සිටියේය.

පෙරදිග භාෂා ඉගෙන ගැනීම මිෂනාරීන්ට නිසැකයෙන්ම පහසු කරුණක් නොවීය. ආසියාවේ භාෂා හැදෑරීම සඳහා යුරෝපීය භාෂාවලින් ලියැවුණු පොත් එකෙක් නොවූ හෙයින් මුල් මිෂනාරීන්ට ඉගෙනීමට සිදු වූයේ වෙහෙස ගෙන දෙන ක්‍රමයක් වූ භාෂාව කථා කිරීමෙනි. පසු කාලයේ පැමිණි මිෂනාරීන්ගේත් වෙනත් ශිෂ්‍යයන්ගේත් ප්‍රයෝජනය සඳහා ව්‍යාකරණ ග්‍රන්ථත් ශබ්දකෝෂත් සම්පාදනය කිරීමේ කාර්යයට මුල පිරුවෝ ඇත්ත වශයෙන් මේ මිෂනාරීහුමය.

පොත් නොතිබීම හැරුණු විට මිෂනාරීන්ට මුහුණ පෑමට සිදු වූ තවත් දුෂ්කරතා තිබුණේය. මෙරට භාෂාත් ඔවුන්ගේ භාෂාවත් අතර පැවති මහත් අසමානතාව මේ දුෂ්කරතාවලින් සුළු එකක් නොවීය. මෙරට භාෂාවල වචනමාලාව යුරෝපීය ජාතිකයාට මහත් බාධාවක් විය. උච්චාරණය ද එබඳුම විය. ඒ කාලයේ පෘතුගීසි වාර්තාවල සංඥා නාම ලියා ඇති ආකාරය නිදසුනක් වශයෙන් ගත හැකිය.

ඒ කෙසේ වෙතත් ජාතික භාෂා හැදෑරීමට මිෂනාරීන් උත්සාහයක් ගත් බව අපට පෙනේ. එලෙස කිරීමට ඔවුන් පෙලඹුණේ දේශීය ජනතාව අතර ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කරලීමට ඔවුන් තුළ පැවති බලවත් ආශාව නිසයි. ලංකාවේ එකල පැවති මිෂනාරි නිකායයන් අතුරින් සිංහලත් දෙමළත් හැදෑරීමට වැඩිම උනන්දුව දැක්වූවෝ ජේසු නිකායිකයෝය. ඔවුන් ලැබූ පුහුණුවත් අධ්‍යාපනය සම්බන්ධයෙන් දැක්වූ සැලකිල්ලත් නිසා ඔවුහු, මිෂනාරීන් අතර උගත්කමට වැඩිම කැමැත්ත දැක්වූ කොටස වූහ.

[ 8 වන පිටුව බලන්න.

**38.** පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන, වචන **300** ක් පමණ වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

*(ලකුණු 30 යි)*

(i) ජනවාර්ගික සහජීවනයෙහි ලා භාෂාව හා සාහිත්‍යය යොදා ගැනීම

(ii) අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීම

(iii) උතුරු කොරියා - එක්සත් ජනපද නායක හමුව හා ආසියාවේ අනාගතය

(iv) අල්ලස හා දූෂණය වැලැක්වීම සඳහා නීතියේ හා චිරන්තන සම්ප්‍රදායේ වැදගත්කම

[ 10 වන පිටුව බලන්න.

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

...............................................................................................................................................................

***